| 0606 | වෛද්‍ය සැපයීම | | | | | | | | | | | | | | | | | |
| 0607 | වෙනත් සැපයීම | | | | | | | | | | | | | | | | | |
| | නඩත්තු වියදම් | | | | | | | | | | | | | | | | | |

| | Ad. Exp. A/C | 1102 | 1105 | 1107 | 1108 | 1113 | 1305 | 1400 | 1410 | 1412 | 1606 | 1703 | 1706 | 1707 | 1708 | 1802 | 1803 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 0701 වාහන | 190,541 | | | | | | | | | | | | | | | | |
| 0702 යන්ත්‍ර හා උපකරණ | 72,340 | | | | | | | | | | | | | | | | |
| 0703 ගොඩනැගිලි | | | | | | | | | | | | | | | | | |
| 0704 ලී බඩු | | | | | | | | | | | | | | | | | |
| 0705 වෙනත් | | | | | | | | | | | | | | | | | |
| **ගිවිසුම් ගත සේවා වියදම්** | | | | | | | | | | | | | | | | | |
| 0801 ප්‍රවාහන | 4,500 | | | | | | | | | | | | | | | | |
| 0802 දුරකථන | 66,968 | | | | | | | | | | | | | | | | |
| 0803 තැපැල් | 9,840 | | | | | | | | | | | | | | | | |
| 0804 විදුලි | | | | | | | | | | | | | | | | | |
| **විස්තරය** | | | | | | | | | | | | | | | | | |
| 0805 ආරක්ෂක සේවා | | | | | | | | | | | | | | | | | |
| 0806 ජලය | | | | | | | | | | | | | | | | | |
| 0807 සනීපාරක්ෂක සේවා | 114,800 | | | | | | | | | | | | | | | | |
| 0808 කුලී වියදම් | | | | | | | | | | | | | | | | | |
| 0809 චරිපනම් හා බදු ගෙවීම් | | | | | | | | | | | | | | | | | |
| 0810 මුද්‍රණ හා ප්‍රචාරක | 127,239 | | | | 71,770 | | | | | | | | | 56,538 | | | |
| 0811 වෙනත් ගිවිසුම් සේවා | | | | | | | | | | | | | | | | | |
| වෙනත් පුණරාවර්තන වියදම් | | | | | | | | | | | | | | | | | |
| පශ්චාත් උ. සඳහා ගමන් | | | | | | | | | | | | | | | | | |
| 0901 වියදම් දීමනා | | | | | | | | | | | | | | | | | |
| විශේෂ සේවා - පාලක සභා | | | | | | | | | | | | | | | | | |
| 0902 හා කමිටු | 24,000 | | | | | | | | | | | | | | | | |
| 0903 විශේෂ සේවා - වෘත්තීය හා | | | | | | | | | | | | | | | | | |
| වෙනත් වියදම් | | | | | | | | | | | | | | | | | |
| 0904 වැඩ මුළු හා සම්මන්ත්‍රණ | | | | | | | | | | | | | | | | | |
| 0905 පර්යේෂණ වියදම් | | | | | | | | | | | | | | | | | |
| 0906 සේවක සංවර්ධ වියදම් | 18,000 | | | | | | | | | | | | | | | | |
| 0907 වෙනත් ආයතන සඳහා ප්‍රදානයන් | | | | | | | | | | | | | | | | | |
| 0908 අනුග්‍රාහක ප්‍රවේශ පත්‍ර හා | | | | | | | | | | | | | | | | | |
| නිදහස් ගමන් බලපත්‍ර | 24,010 | | | | | | | | | | | | | | | | |
| 0909 සංග්‍රහ වියදම් | 45,899 | | | | | | | | 320 | | | | 840 | | | | |
| 0910 බැංකු ගාස්තු | 9,520 | | | | | | | | | | | | | | | | |
| 0911 ප්‍රදානය | | | | | | | | | | | | | | | | | |
| 0913 උපාධි ප්‍රදාන උත්සව වියදම් | | | | | | | | | | | | | | | | | |
| 0914 විභාග වියදම් | | | | | | | 4,200 | 510 | 10,200 | 3,310 | 6,900 | 16,625 | 5,590 | 27,800 | 23,815 | 3,010 | 6,960 |
| 0915 වෙනත් පුනරාවර්තන | | | | | | | | | | | | | | | | | |
| වියදම් | 26,304 | | | | 6,000 | 680 | 6,000 | | 14,460 | 8,000 | | 6,000 | | 6,000 | 14,000 | 2,000 | |
| | **115,354** | **14,400** | **25,200** | **22,500** | **103,870** | **6,680** | **71,200** | **11,910** | **48,080** | **62,910** | **8,400** | **38,625** | **6,430** | **99,338** | **68,315** | **12,010** | **30,960** |

සටහන් 01

**වියදම් ලේඛණය**

*විස්තරය*

| | *1806* | *1807* | *1813* | *1814* | *1815* | *1816* | *Mphill/P. hD-7* | *Wo.shop & Sem.Ex* | *Treasury fun* | *Sub Total* | *Total* |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 04101 වැටුප් හා වේතන | | | | | | | | | 1,366,924 | 1,366,924 | |
| 04102 වි.අ.අ. | | | | | | | | | 119,690 | 119,690 | |
| 04103 විශ්‍රාම වැටුප් | | | | | | | | | | | |
| 04104 සේ. නි. භා. අ. | | | | | | | | | 136,789 | 136,789 | |
| | | | | | | | | | 51,296 | 51,296 | |

| | | *1806* | *1807* | *1813* | *1814* | *1815* | *1816* | *Mphill/P. hD-7* | *Wo.shop & Sem.Ex* | *Treasury fun* | *Sub Total* | *Total* |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 04105 | වැඩ බැලීමේ ගෙවීම් (10%) | | | | | | | | | - | - | |
| 04108 | අධ්‍යන දීමනාව | | | | | | | | | 343,961 | 343,961 | |
| 04113 | හිඟවැටුප් | | | | | | | | | - | - | |
| | අන්තර් දීමනාව | | | | | | | | | 189,000 | 189,000 | |
| | ජීවන වියදම් දීමනාව | | | | | | | | | | | |
| 04201 | වැටුප් හා වේතන | | | | | | | | | 2,986,540 | 2,986,540 | |
| 04202 | වි.අ.අ. | | | | | | | | | 397,757 | 397,757 | |
| 04203 | විශ්‍රාම වැටුප් | | | | | | | | | 50,378 | 50,378 | |
| 04204 | සෙ. නි. භා. අ. | | | | | | | | | 89,627 | 89,627 | |
| 04205 | වැඩ බැලීමේ දීමනාව | | | | | | | | | - | - | |
| 04208 | අතිකාල දීමනා | | | | | | | | | - | 196,788 | |
| 04209 | නිවාඩු දින වැඩ දීමනා | | | | | | | | | - | 14,328 | |
| 04211 | භාෂා ප්‍රවීණතා දීමනා | | | | | | | | | 20,190 | 20,190 | |
| 04213 | අන්තර් දීමනා රු. 1200 | | | | | | | | | - | - | |
| | බාහිර කථිකාචාර්යවරුන් | | | | | | | | | | | |
| | සඳහා ගාස්තු | | 87,500 | 54,375 | | 62,250 | 32,250 | | 116,000 | 434,734 | 434,734 | |
| | ගමන් වියදම් | | | | | | | | | | | |
| 0501 | දේශීය | | | | | | | | | - | 681,675 | 7,079,676 |
| 0502 | විදේශීය | | | | | | | | | - | 3,500 | |
| | සැපයුම් | | | | | | | | | - | - | 3,500 |
| | ලිපි ද්‍රව්‍ය හා කාර්යාල | | | | | | | | | | | |
| 0601 | උපකරණ | | | | | | | | 4,722 | | | |
| 0602 | ඉන්ධන හා සේවා වියදම් | | | | | | | | | 51,255 | 142,775 | |
| 0603 | නිල ඇඳුම් සහ මැසුම් කුළී | | | | | | | | | 98,804 | 177,519 | |
| 0604 | යාන්ත්‍රික හා විදුලි භාණ්ඩ | | | | | | | | | 4,280 | 5,545 | |
| 0605 | රසායන හා වීදුරු භාණ්ඩ | | | | | | | | | 66,249 | 66,249 | |
| 0606 | වෛද්‍ය සැපයීම් | | | | | | | | | - | - | |
| 0607 | වෙනත් සැපයීම් | | | | | | | | | 89,895 | 89,895 | 481,982 |
| | නඩත්තු වියදම් | | | | | | | | | | | |
| 0701 | වාහන | | | | | | | | | 100,951 | 291,492 | |
| 0702 | යන්ත්‍ර හා උපකරණ | | | | | | | | | 166,522 | 238,861 | |
| 0703 | ගොඩනැගිලි | | | | | | | | | | | |
| 0704 | ලී බඩු | | | | | | | | | - | - | |
| 0705 | වෙනත් | | | | | | | | | - | - | 530,353 |
| **ගිවිසුම් ගත සේවා වියදම්** | | | | | | | | | | - | - | |
| 0801 | ප්‍රවාහන | | | | | | | | | - | 4,500 | |
| 0802 | දුරකථන | | | | | | | | | 70,559 | 137,527 | |
| 0803 | තැපැල් | | | | | | | | | 8,005 | 17,845 | |
| 0804 | විදුලි | | | | | | | | | | | |
| 0805 | ආරක්ෂක සේවා | | | | | | | | | - | - | |
| 0806 | ජලය | | | | | | | | | - | - | |
| 0807 | සනීපාරක්ෂක සේවා | | | | | | | | | 232,308 | 347,108 | |
| 0808 | කුලී වියදම් | | | | | | | | | - | - | |
| 0809 | වරිපනම් හා බදු ගෙවීම් | | | | | | | | | - | - | |
| 0810 | මුද්‍රණ හා ප්‍රචාරක | | | | | | | | 99,187 | 29,120 | 383,853 | |
| 0811 | වෙනත් ගිවිසුම් සේවා | | | | | | | | | | - | 890,833 |
| | වෙනත් පුනරාවර්තන වියදම් | | | | | | | | | - | - | |
| 0901 | පශ්චාත් උ. සඳහා ගමන් | | | | | | | | | - | - | |
| | වියදම් දීමනා | | | | | | | | | | | |
| 0902 | විශේෂ සේවා - පාලක සභා | | | | | | | | | | | |
| | හා කමිටු | | | | | | | | | 24,500 | 48,500 | |
| 0903 | විශේෂ සේවා - වෘත්තිය හා වෙනත් වියදම් | | | | | | | | | 129,000 | 129,000 | |
| 0904 | වැඩ මුළු හා සම්මන්ත්‍රණ | | | | | | | | | - | - | |
| 0905 | පර්යේෂණ වියදම් | | | | | | | | | - | 18,000 | |
| 0906 | සේවක සංවර්ධ වියදම් | | | | | | | | | - | - | |

| | *1806* | *1807* | *1813* | *1814* | *1815* | *1816* | *Mphill/P. RD-7* | *Wo.shop & Sem.Ex* | *Tressury* | *Sub Total* | *Total* |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 0907 වෙනත් ආයතන සඳහා ප්‍රදානයන් | - | | | | | | | | | | |
| 0908 අනුග්‍රාහක ප්‍රවේශපත්‍ර හා නිදහස් ගමන් බලපත්‍ර | | | | | | | | | 11,950 | 35,960 | |
| 0909 සංග්‍රහ වියදම් | | | | | | | 2,977 | 45,305 | 121,387 | 216,728 | |
| 0910 බැංකු ගාස්තු | | | | | | | | | 8,400 | 17,920 | |
| 0911 ප්‍රදානය | | | | | | | | | | | |
| 0913 උපාධි ප්‍රදාන උත්සව වියදම් | | | | | | | | | | | |
| 0914 විභාග වියදම් | 3,300 | 5,835 | 10,040 | 250 | 5,370 | 4,650 | | | - | 138,365 | |
| 0915 වෙනත් පුනරාවර්තන වියදම් | | 11,000 | 6,000 | | 4,000 | | 31,500 | 19,800 | 24,968 | 186,712 | |
| | | | | | | | | | | | 791,184 |
| | **3,300** | **104,335** | **70,415** | **250** | **71,620** | **36,900** | **34,477** | **285,014** | **7,425,036** | **9,777,529** | **9,777,529** |

සටහන් 03

**ක්ෂය සඳහා වෙන් කිරීම්**

| | *වත්කම් වර්ගය* | *ආරම්භක ශේෂය (රු.)* | *මිලදී ගැනීම් (රු.)* | *පරිත්‍යාග (රු.)* | *ඉවත් කිරීම් (රු.)* | *අවසාන ශේෂය (රු.)* |
|---|---|---|---|---|---|---|
| 1. | ඉඩම් හා ගොඩනැගිලි | 721,568 | 0 | 0 | 0 | 721,568 |
| 2. | ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ | 9,193,147 | 0 | 0 | 0 | 9,193,147 |
| 3. | පරිඝණක හා මුද්‍රණ යන්ත්‍ර | 6,422,547 | 961,012 | 0 | 0 | 7,383,559 |
| 4. | වැද්දුම් හා සවිකිරීම් | 0 | 0 | 0 | 0 | |
| 5. | පුස්තකාල පොත් හා සඟරා | 6,806,494 | 72,187 | 0 | 0 | 6,878,681 |
| 6. | මෝටර් රථ | 3,603,493 | 0 | 0 | 0 | 3,603,493 |
| 7. | වෙනත් | 33,290 | 0 | 0 | 0 | 33,290 |
| | **එකතුව** | **26,780,539** | **1,033,199** | **0** | **0** | **27,813,738** |

| | අඩු කළා : ක්ෂය කිරීම් | *ආරම්භක ශේෂය (රු.)* | *වර්ෂය සඳහා ක්ෂය වෙන් කිරීම (රු.)* | *ක්ෂය අනුපාතය (රු)* | *ඉවත් කිරීම් (රු)* | *අවසාන ශේෂය (රු)* |
|---|---|---|---|---|---|---|
| 1. | ඉඩම් හා ගොඩනැගිලි | 282,916 | 36,078 | 5% | 0 | 318,994 |
| 2. | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 6,680,130 | 919,315 | 10% | 0 | 7,599,445 |
| 3. | කොම්පියුටර හා ප්‍රින්ටර | 5,251,052 | 381,455 | 20% | 0 | 5,632,507 |
| 4. | වැද්දුම් හා සවිකිරීම් | 0 | 0 | 0% | 0 | 0 |
| 5. | පුස්තකාල පොත් හා සඟරා | 6,254,759 | 390,632 | 20% | 0 | 6,645,391 |
| 6. | මෝටර් රථ | 2,162,096 | 360,349 | 10% | 0 | 2,522,445 |
| 7. | වෙනත් | 29,961 | 3,329 | 10% | 0 | 33,290 |
| | **එකතුව** | **20,660,914** | **2,091,158** | | **0** | **22,752,073** |

| | ශුද්ධ වටිනාකම | *ආරම්භක ශේෂය (රු.)* | *වර්ෂය සඳහා ක්ෂය වෙන් කිරීම් (රු.)* | *මිලදී ගැනීම් (රු.)* | | |
|---|---|---|---|---|---|---|
| 1. | ඉඩම් හා ගොඩනැගිලි | 438,653 | -36,078 | 0 | 0 | 402,574 |
| 2. | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 2,513,017 | -919,315 | 0 | 0 | 1,593,702 |
| 3. | කොම්පියුටර හා ප්‍රින්ටර | 1,171,495 | -381,455 | 961,012 | 0 | 1,751,052 |
| 4. | වැද්දුම් හා සවිකිරීම් | 0 | 0 | 0 | 0 | 0 |
| 5. | පුස්තකාල පොත් හා සගරා | 551,735 | -390,632 | 72,187 | 0 | 233,290 |
| 6. | මෝටර් රථ | 1,441,397 | -360,349 | 0 | 0 | 1,081,048 |
| 7. | වෙනත් | 3,329 | -3,329 | 0 | 0 | 0 |
| | **එකතුව** | **6,119,626** | **-2,091,158** | **1,033,199** | **0** | **5,061,666** |

සටහන් 02

**පාරිතෝෂික දීමනා වෙන්කිරීම් ගණනය**

| | | *සේවයට බැඳුණු දිනය* | *සේවා කාලය* | *මූලික වැටුප් රු.* | *ප්‍රතිපාදන රු.* |
|---|---|---|---|---|---|
| සේවකයාගේ නම | | | | | |
| 1. | අශෝකා අබේරත්න මිය | 19 - ජුනි - 1982 | 29 | 28,655 | 4,15,498 |
| 2. | ඒ. එ. ජේ. අබේසිංහ මයා | 16 - ජූලි - 1982 | 34 | 22,180 | 3,77,060 |
| 3. | එම්. එල්. ඒ. ජේ. ජයමිණි මිය | 16 - නොවැ - 00 | 10 | 19,650 | 98,250 |
| 4. | යූ. පී. අලහකෝන් | 01 - නොවැ - 04 | 6 | 29,240 | 87,720 |
| 5. | පී. ජී. ප්‍රේමදාස | 06 - ජුනි - 05 | 5 | 41,850 | 1,04,625 |
| 6. | ආර්. පී. පී. රණවීර | 15 - ජුනි - 05 | 5 | 41,850 | 1,04,625 |
| එකතුව | | | | | 11,87,778 |
| *අඩු කළා :* ආරම්භක ශේෂය 2010.01.01 | | | | | 12,73,012 |
| ප්‍රතිපාදන - ගාමිණී මයා | | | | | |
| | | | | | 3,47,400 |
| එකතුව | | | | | 9,25,612 |
| 2010 සඳහා අවශ්‍ය ප්‍රතිපාදන | | | | | 2,62,166 |

සටහන් 04

**සේවක ණය හා අත්තිකාරම්**

| ණය වර්ගය | | |
|---|---|---|
| 1. | පරිගණක ණය | 9,330 |
| 2. | වාහන ණය | 99,855 |
| 3. | ආපදා ණය | 9,71,376 |
| 4. | උත්සව අත්තිකාරම් | 9,000 |
| 5. | සේවක ණය | 850 |
| 6. | විශේෂ අත්තිකාරම් | 0 |
| | | 10,90,411 |

සටහන් 05

**ඉදිරි ගෙවීම්**

| | | |
|---|---|---|
| 1. | සේවා ගිවිසුම් 2011 | 45,700 |
| 2. | වාහන රක්ෂණ වියදම් 2011 | 30,494 |
| 3. | පුවත්පත් සඳහා වියදම් | 5,200 |
| | | 81,394 |

සටහන් 06

මුදල් ගිණුම් ශේෂයන් 2009.12.31 දිනට

| | | |
|---|---|---|
| 1. | මහජන බැංකුව තිඹිරිගස්යාය ජංගම ගිණුම | |
| | 165-005922-3 | 5,00,831 |
| | 165-006296-1 | 8,42,535 |
| | | 13,43,365 |

| | | සේවයට බැඳුණු දිනය | සේවා කාලය | මූලික වැටුප් රු. | ප්‍රතිපාදන රු. |
|---|---|---|---|---|---|

සටහන් 07

**උපචිත වියදම්**

| | | |
|---|---|---|
| 1. | දුරකථන වියදම් - දෙසැ. 2010 | 25,301 |
| 2. | විශේෂ සේවා 2008-2010 විගණන ගාස්තු | 3,33,000 |
| 3. | අනෙකුත් පුනරාවර්තන වියදම් | 7,410 |
| 4. | ජීවන වියදම් දීමනා | 28,700 |
| | | 3,94,411 |

සටහන් 08

**පාඨමාලා ශේෂයන්**

| | | |
|---|---|---|
| 1. | සුනාමි වැඩසටහන | 5,33,750 |
| 2. | වැඩමුළු ආදායම් - 2008 | 77,625 |
| 3. | පර්යේෂණ වැඩසටහන - 2009 | 17,500 |
| 4. | පුස්තකාල සහකාරවරුන් සඳහා පුහුණු පාඨමාලාව | 9,893 |
| 5. | තොරතුරු සාක්ෂරතා පුහුණු පාඨමාලාව - 2009 | 45,182 |
| 6. | පරිගණක යෙදුම් සහකාරවරුන් සඳහා පුහුණු පාඨමාලාව | 43,250 |
| 7. | මහජන පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව 09- 11 | 6,000 |
| 8. | මහජන පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව 10 | 40,600 |
| 9. | මහජන පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ සහිතක පත්‍ර පාඨාමාලව 11 | 750 |
| 10. | පාසල් පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව 2010 | 2,20,750 |
| 11. | පාසල් පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව 2011 | 2,250 |
| 12. | පුස්තකාල හා තොරතුරු කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 08 | 83,250 |
| 13. | පාසල් පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2008 | 2,250 |
| 14. | මහජන පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2011 | 250 |
| 15. | පුස්තකාල හා තොරතුරු කළමනාකරණය පිළිබඳ ඩිප්ලේමා පාඨමාලාව 10 | 9,300 |
| 16. | ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව 2007 | 8,450 |
| 17. | ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 2007 | 20,070 |
| 18. | පුස්තකාල හා තොරතුරු කළමනාකරණය පිළිබඳ ප්‍රථම සහතික පත්‍ර පාඨමාලාව 08 | 1,96,330 |
| 19. | පුස්තකාල හා තොරතුරු කළමනාකරණය පිළිබඳ ප්‍රථම සහතික පත්‍ර පාඨමාලාව 10 | 1,16,840 |
| 20. | පුස්තකාල හා තොරතුරු කළමනාකරණ අන්තර් මාධ්‍ය පාඨමාලාව 10 | (16,710) |
| 21. | ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 07 - අර්ධ කාලීන | 89,340 |
| 22. | ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 10- පූර්ණ කාලීන | 7,000 |
| 23. | ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 09 - අර්ධ කාලීන | 1,95,167 |
| 24. | ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 09 - පූර්ණ කාලීන | 2,99,285 |
| 25. | ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 10 - අර්ධ කාලීන | 1,23,390 |
| 26. | ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 10 - පූර්ණ කාලීන | 1,98,150 |
| 27. | ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ විද්‍යාපති උපාධිය 06 | 58.833 |
| 28. | ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ විද්‍යාපති උපාධිය 08 | 1,02,050 |
| 29. | ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ විද්‍යාපති උපාධිය - පූර්ණ කාලීන | 2,34,700 |
| 30. | ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ විද්‍යාපති උපාධිය - අර්ධ කාලීන | 90,750 |
| 31. | ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ විද්‍යාපති උපාධිය 2011 | 500 |
| 32. | පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2008 | 3,750 |
| 33. | පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය 2009 | 2,52,700 |
| 34 | Phil/PhD-07 | 4,49,518 |
| | | **35,22,783** |

සටහන් 09

**පෙර වර්ෂ ගැළපුම්**

| | |
|---|---|
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 3,47,400 |
| පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර සඳහා ඌණ ක්ෂය වෙන්කිරීම් | 7,400 |
| | **340,000** |

මගේ අංකය ː සීඊ/ජී/එන්අයිඑල්අයිඑස්/එෆ්ජ්/10.

විගණකාධිපති දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ,
ජාතික පුස්තකාල හා විඥපන විද්‍යා ආයතනය.

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (I) හා III වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) හා (7) උපවගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම ː-

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම ː-

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය ː

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම ː

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 99 වගන්තිය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිගේ අංක UGC/FA/GH/2002 හා 2003 ජනවාරි 13 දිනැති ලිපියට පටහැනිව කටයුතු කරමින්, ආයතනයේ ආදායමට බැර කළයුතුව තිබූ 2008 වර්ෂය සඳහා වූ පාඨමාලා ගාස්තු ආදායමින් කොටසක් යොදා ගොඩනගා තිබූ "සංවර්ධන අරමුදලෙන්" රු. 673,198 ක් උපයෝගී කරගෙන සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර වත්කම් මිලදී ගෙන තිබූ අතර එම වටිනාකම පොදු සංචිතයට ගළපනු වෙනුවට "රජයේ ප්‍රාග්ධන ප්‍රදාන'' ගිණුමට බැර කර තිබුණි.

(ආ) පුස්තකාල හා තොරතුරු කළමනාකරණය පිළිබඳ අන්තර් මාධ්‍ය සහතික පාඨමාලාව 09 (Intermediate Certificate in Library and Information Management 09) වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ආදායම් රු.16,710 ක් ඉදිරියට ලැබූ පාඨමාලා ආදායමට හිලව් කර දක්වා තිබුණි.

2.2.2. නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම :

2003 ජුනි 02 වැනි දින හා අංක පී. ඊ. ඩී. 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.6 ඡේදය ප්‍රකාරව කාර්තුමය කාර්යය සාධක වාර්තා සකස් කර නොතිබුණි.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය :

3.1 මූල්‍ය සමාලෝචනය :

3.1.1 මූල්‍ය ප්‍රතිඵල :

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු. 8,430,218 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 7,670,113 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රු. 5,855,000 ක් වූ රජයේ ප්‍රදානය හේතුකොටගෙන ඌනතාවය රු. 2,575,218 ක් දක්වා අඩුවී තිබූ අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු. 5,497,000 ක් වූ රජයේ ප්‍රදානය හේතු කොට ගෙන එම ඌනතාවය රු. 2,173,113 ක් දක්වා අඩු වී තිබුණි.

3.2 මෙහෙයුම් සමාලෝචනය :

3.2.1 කාර්ය සාධනය :

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ලෝක බැංකුවේ දෙවන සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘති ආධාර යටතේ ස්ථාපිත කර ඇති ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ මූලික අරමුණ වාර්ෂිකව සිසුන් 300-400 ත් අතර ප්‍රමාණයක් පුහුණු කිරීම වූ නමුත් පාඨමාලා ආරම්භ කරන ලද 2003 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වාම ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව ඊට වඩා අඩු වූ අතර එයින්ද සැලකිය යුතු කොටසක් පාඨමාලා සාර්ථකව අවසන් කර නොතිබුණි.

| *වර්ෂය* | *පාඨමාලා සංඛ්‍යාව* | *ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව* | *පාඨමාලාව සාර්ථකව අවසන් කළ සිසුන්* | |
|---|---|---|---|---|
| | | | *සංඛ්‍යාව* | *ප්‍රතිශතය%* |
| 2004.12.31 දක්වා | 09 | 344 | 201 | 58% |
| 2005 | 08 | 191 | 80 | 42% |
| 2006 | 06 | 133 | 70 | 53% |
| 2007 | 10 | 215 | 96 | 45% |
| 2008 | 06 | 178 | 114 | 64% |
| 2009 | 03 | 111 | 63 | 57% |
| | 02 | 16 | පාඨමාලා අවසන් කර ඇත. | - |
| 2010 | 07 | 102 | - එම- | - |

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත පහත සඳහන් කාර්යයන් 06 ක් ක්‍රියාත්මක කොට නොතිබුණි.

(i) වාර්ෂික සම්මන්ත්‍රණය (NILIS Symposium)
(ii) කුඩා පරිමාණ පර්යේෂණ ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කිරීම
(iii) ප්‍රචාරණය සඳහා විස්තර පත්‍රිකා බෙදා හැරීම
(iv) විද්‍යුත් සඟරා (E-Journal) පිළියෙල කිරීම
(v) දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
(vi) ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සමඟ පැවැත්වෙන සහයෝගීතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

(ඇ) ආයතනය විසින් පවත්වාගෙන යනු ලැබූ පාඨමාලා 06 ක් නියමිත කාලය තුළ අවසන් කර නොතිබුණි. ප්‍රමාද කාලය මාස 02 සිට වසර 01 ත් මාස 05 ත් අතර විය.

3.3 කළමනාකරණ අකාර්‍යක්ෂමතා :

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

3.3.1 සුනාමි වැඩසටහන

පුස්තකාල ක්ෂේත්‍රයේ සංවර්ධන කාර්යයන් වෙනුවෙන් කැනේඩියානු පුස්තකාල සංගමය මගින් 2007 ඔක්තෝබර් 05 වැනි දින ලබා දී තිබූ රු. 533,000 ක් වූ ආධාර මුදලෙන් අදාළ කාර්යයන් ඉටු නොකර සමාලෝචිත වර්ෂය අවසානය වන විට වසර 03 ක ටත් ආසන්න කාලයක් බැංකු ජංගම ගිණුමක නිෂ්ක්‍රීයව තබා තිබුණි.

3.3.2 තොග හා ස්ථාවර වත්කම් පාලනය

(අ) භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් පත් භාවිතා කිරීමත්, තොග පොත අධීක්ෂණය කිරීමත්, වර්ෂය අවසානයට තොග පොත තුලනය කිරීමත් සිදු කර නොතිබූ අතර භෞතික තොග ශේෂයම තොග ලේඛනයේ ශේෂය ලෙස සමීක්ෂණ වාර්තාවේ දක්වා තිබුණි.
(ආ) භාණ්ඩ සමීක්ෂණ සිදුකල යුතු දිනවකවානු සමීක්ෂණ මණ්ඩල පත්කිරීමේ ලිපියෙහි සඳහන්ව නොතිබුණි.
(ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 හා 2002 නොවැම්බර් 28 වැනි දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් සහ පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධ ලේඛනයක් පවත්වා නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට පරිගණක, උපාංග හා මෘදුකාංග පිරිවැය රු. 7,383,559 ක් ද පුස්තකාල පොත් හැර අනෙකුත් ස්ථාවර වත්කම් පිරිවැය රු.13,551,498 ක් ද විය.
(ඈ) මු. රෙ. 756 ප්‍රකාරව පොත් හා වාර සඟරා සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණයක් ආයතනය ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සිදු කර නොතිබූ අතර 2010 දෙසැම්බර් 31 වැනි දිනට පොත් තොගයේ පිරිවැය රු. 6,878,681 ක් වී තිබුණි.
(ඉ) 2010 ජූනි 30 දිනැති අබලි භාණ්ඩ වෙන්දේසියේදී අලෙවි කරන ලද පරිගණක මොනිටර්, 07 කට අදාළ වටිනාකම් ගණනය කර ඒවා ගිණුම්වලින් ඉවත් කිරීමටත් ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සටහන් කිරීමටත් කටයුතු කර නොතිබුණි.
(ඊ) අළුත්වැඩියා කළ යුතු, විකිණිය යුතු හා විනාශ කළ යුතු බවට නිර්දේශිත භාණ්ඩ ඒකක 18 ක් සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.3.3 මුල්‍ය පාලනය :

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) මුදල් රෙගුලාසි 395(ඌ) ඡේදයෙන් බැහැරව දෛනික ලැබීම් බැංකු ගත කිරීම, මුදල් පොත පවත්වාගෙන යාම හා බැංකු සැසඳුම් පිළියෙල කිරීම, යන සියලු කාරණයන් එකම නිලධාරියෙකු විසින් සිදු කර තිබුණි.
(ආ) මුදල් ලැබීම් නියමිත දිනට මුදල් පොතේ සටහන් කර නොතිබුණි.
(ඇ) මුදල් පොතේ ප්‍රමාණවත් මුදල් ශේෂයක් නොතිබියදී චෙක්පත් ලියා තිබුණි.
(ඈ) ලැබී තිබූ මුදල් ඇණවුම් අප්‍රමාදව නිරවලු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු :

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 89 වගන්තිය, 1959 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 47 වගන්තිය සහ 1988 අංක 47 දරන සේවක භාරකාර අරමුදල් පනතේ 16(2) වගන්තියට පටහැනිව විශ්ව විද්‍යාල අර්ථ සාධක අරමුදල, විශ්‍රාම වැටුප් සහ සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගණනය කිරීමේදී "අධ්‍යයන දීමනාව" සැලකිල්ලට ගැනීම හේතුවෙන් අදාළ අරමුදල් සඳහා රු. 96,309 ක් වැඩිපුර ගෙවා තිබුණි.
(ආ) 2002 ඔක්තෝබර් 25 දිනැති අංක බීඩී/පීඑෆ්/1/174/1 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ උපදෙස්වලින් බැහැරව භාෂා ප්‍රවීණතා දීමනා ලෙස රු. 20,190 ක් ගෙවා තිබුණි.

3.5 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම :

ආයතනයේ සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම, 2003 ජූනි 02 දින හා අංක PED/12 දරන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සකස් කර නොතිබූ අතර එය පාලන උපකරණයක් ලෙසද යොදාගෙන නොතිබුණි.

3.6 අයවැය පාලනය :

පාඨමාලා 03 ක අයවැයගත වියදම හා සත්‍ය වියදම අතර 65% සිට 82% අතර විචලතාවයන් නිරීක්ෂණය වීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණි.

04. **පද්ධති හා පාලන :**

විගණනයේදී නිරීක්ෂණ වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින් වර යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු ය.

(අ) මූල්‍ය පාලනය
(ආ) ගිණුම්කරණය
(ඇ) තොග
(ඈ) ස්ථාවර වත්කම්
(ඉ) කාර්ය සාධනය
(ඊ) සැලසුම්කරණය

එච්. ඒ. එස්. සමරවීර,
වැඩබලන විගණකාධිපති.

මගේ අංකය : NILIS 35/2.

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ඔබගේ අංක සීඊ/ජී/එන්අයිඑල්අයිඑස්/එෆ්ඒ/10 2011 ජූලි 18 දිනැති ඉහත සඳහන් විගණන වාර්තාව හා බැඳේ.

අදාළ විගණන වාර්තාව සම්බන්ධයෙන් මෙම ආයතනයේ අදහස්, මේ සමඟ කාරුණිකව ඉදිරිපත් කරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම :

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු :

(අ) 2011.09.02 දිනැති ජ'නල් සටහන් අංක 01 මගින් නිවැරදි කර ඇත.
(ආ) මෙම රු. 16,710 ක මුදල ශේෂ පත්‍රයේ වගකීම් යටතේ පෙන්වනු වෙනුවට වත්කම් යටතේ පෙන්වා තිබීමෙන් මෙම වරද සිදු වී ඇත. මෙවැනි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී සිදුවන වැරදි වළක්වාගැනීමට ඉදිරි වර්ෂවල ගිණුම් පිළියෙල කිරීමේදී කටයුතු කරනු ඇත.

2.2.2 නීතිරීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම :

කාර්තුමය කාර්ය සාධන වාර්තා පිළියෙල කර ඇත.

3.2 මෙහෙයුම් සමාලෝචනය :

3.2.1 කාර්ය සාධනය :

(අ) අප ආයතනය ලබාදෙන සහතික පිළිගැනීමටත්, ගුරු පුස්තකාලාධිපතින්ගේ වෘත්තීය සුදුසුකම් ගුරු සේවා ව්‍යවස්ථාවට ඇතුළත් කිරීමටත් 2008 වසරේ අමාත්‍ය මණ්ඩල තීරණය මේ දක්වා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර නැති බැවින් පාඨමාලා සඳහා ලියාපදිංචි වීමට ගුරුවරුන් මැලිකමක් දක්වයි. මේ තත්වයට සම්පූර්ණ වගකීම් අධ්‍යාපන අමාත්‍යාංශය දැරිය යුතු බව පසුගිය COPE කමිටුවේදී ද පෙන්වා දී ඇත.

ලියාපදිංචි සංඛ්‍යාවෙන් කොටසක් පාඨමාලා අවසන් කර නොතිබීමට ප්‍රධාන හේතුව වන්නේ මොවුන් විසින් සම්පූර්ණ කළයුතු පර්යේෂණ නිබන්ධනය නියමිත දින වකවානුවලදී ලබා නොදීමයි. ඒ හේතුවෙන් අදාළ ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත සහතික පත් නිකුත් කිරීමට නොහැකි වී ඇත. ඒ පිළිබඳ ඔවුන් වෙත සිහිකැඳවීම් යවා ඇත.

(ආ) මෙහි සඳහන් (ii) සහ (v) හැරුණු විට අනෙකුත් සියලුම කටයුතු කිරීමට අවශ්‍ය මූලික පියවර ගෙන ඇත. වාර්ෂික සම්මන්ත්‍රණය (NILIS Symposium) 2011 අගෝස්තු මස 1 වැනි දින පවත්වන ලදී. අධ්‍යයන කාර්යමණ්ඩලයේ දෙදෙනෙකු පමණක් සිටීමත් ඔවුන්ගේ කාර්යබහුලත්වය නිසා සෘජු පර්යේෂණවල නිරත වීමට අවකාශයක් නොමැත. එසේ වුවද ශිෂ්‍යයන්ගේ පර්යේෂණ

කටයුතුවලට උපදෙස් දෙමින් හා දායකවීමෙන් ඔවුන් පර්යේෂණ කටයුතුවලට සම්බන්ධවේ. දැනට ආයතනයේ ඇති සීමිත අධ්‍යයන කාර්ය මණ්ඩලය හා සීමිත ICT පහසුකම් සමග දුරස්ථ අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අපහසු බව අධ්‍යයන කමිටුවෙහි සඳහන් වී ඇත.

(ඇ) පාඨමාලා අවසන් වීමෙන් අනතුරුව විභාග පැවැත්වීම, පිළිතුරු පත්‍ර පරීක්ෂාව, ව්‍යාපෘති වාර්තා සකස් කිරීම, ව්‍යාපෘති වාර්තා පරීක්ෂා කිරීම, විභාග ප්‍රතිඵල කළමනාකරණය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම වැනි කාර්යයන් සඳහා අමතර කාලයක් වැයවීම හේතුවෙන් ඇතැම් පාඨමාලා නියමිත කාලය තුළ අවසන් කිරීමට නොහැකි වී ඇත.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

3.3.1 සුනාමි වැඩසටහන

2008-2010 කාලය තුළ මෙම සුනාමියෙන් බලපෑමට ලක් වූ පුස්තකාල සඳහා මුලදී අතිරික්ත පොත් ලැබී තිබූ නිසා පොත් ලබා දීම තාවකාලිකව නතර කිරීමට උපදෙස් ලැබී තිබිණි. මෙම මුදලෙන් රු. 2,50,695.73 ක මුදලක් 2011 වර්ෂයේ මේ දක්වා කාලය තුළ දී වැයකර පොත් ලබා දී ඇත. ඉතිරි මුදල් සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අනෙකුත් පාසැල්වලට, අදාල පාසැල් පොත් මිල දී ගැනීමට බලාපොරොත්තුවන පොත් අළෙවිසැල්වලින් මිල කැඳවීම් ඉදිරිපත් කරන ලෙස දන්වා යවා ඇති අතර මීට අමතරව සිහි කැඳවීම් කිහිපයක් ද යවා ඇත. අදාල පාසල්වල කළමණාකාරිත්වය මේ පිළිබඳ දක්වන අල්ප උනන්දුව මේ තත්වයට හේතු වී ඇති බව පෙනේ.

3.3.2 තොග හා ස්ථාවර වත්කම් පාලනය

(අ) වර්ෂය අවසානයේදී තොග පොත තුලනය කර 2011 වර්ෂය සඳහා ආරම්භක ශේෂය නව පොතෙහි ඉදිරියට ගෙන ගිය ද ප්‍රමාද දෝෂයකින් 2010 තොග පොතෙහි, වර්ෂ අවසාන තුලනය කිරීම් සටහන් යෙදීමට නොහැකි වී ඇත. මේ වන විට මෙය නිවැරදි කර ඇත ;

(ආ) භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්වීම් ලිපිවල භාණ්ඩ සමීක්ෂණය සිදුකළ යුතු දින වකවානු සටහන් කිරීමට 2011 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සිදුකරන අවස්ථාවේදී පියවර ගනු ඇත ;

(ඇ) ස්ථාවර වත්කම් ලේඛනය සහ පරිඝණක උපාංග සඳහාවන ලේඛනය ඉදිරියේදී කරනු ලබන මිලදීගැනීම්වලදී නව ආකෘතිවලට අනුව පිළියෙල කිරීමට කටයුතු කරනු ඇත ;

(ඈ) පොත් හා වාර සඟරා සම්බන්ධ සමීක්ෂණය මේ වන විට විශාල ප්‍රමාණයකින් අවසන් කර ඇත ;

(ඉ) මෙම මොනිටර් 7 ඇතුළත් පරිගණක ඒකක 07 ක් ලෙස මිලදී ගෙන ඇති නිසා එක් එක් ඒකකයේ පිරිවැය සොයාගතහැකි නමුත් මොනිටර් 07 හි පිරිවැය වෙනවෙනම සොයාගත නොහැකි වී ඇත. එබැවින් මෙම මොනිටර් 7 හි පිරිවැය සහ සමුච්චිත ක්ෂය මෙම පරිගණකවල ඉතිරි උපාංග විකිණීමේ දී ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත. දැනට මෙම පරිගණක පූර්ණ වශයෙන් ක්ෂය වී ඇති අතර, මෙම මොනිටර් 7 හි වර්තමාන වෙළඳපොල වටිනාකම සැලකිල්ලට ගත්තද පිරිවැය සහ සමුච්චිත ක්ෂය ගිණුම්වලින් ඉවත් නොකිරීමෙන් ගිණුම්වලට ඇතිකරන බලපෑම නොසැලකියහැකි තරම්ය ;

(ඊ) මෙම භාණ්ඩ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගෙන ඇත.

3.3.3 මූල්‍ය පාලනය

(අ) මුදල් රෙගුලාසි 395(ඌ) ඡේදයට අනුව බැංකු සැසඳුම් ප්‍රකාශය දැනට අනෙකුත් ගිණුම් කටයුතුවල නොයෙදෙන පුද්ගලයෙකු විසින් පිළියෙල කරනු ලබයි ;

(ආ) මුදල් පොතේ ලැබීම් සටහන් කරනු ලැබේ ;

(ඇ) වර්තමානයේ මෙවන් තත්ත්වයක් නොපවතියි ;

(ඈ) මෙම මුදල් ඇණවුම් සියල්ල දැනට උපලබ්ධි වී ඇත.

3. 4 (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති විසින් නිකුත් කරන ලද 2005.03.24 දිනැති යූජීසී/එච්ආර්/3/9/480 ලිපියට අනුව මෙම ගෙවීම් සිදු කර ඇත. එහෙත් 2011.04.28 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 955 මගින් ඉහත සඳහන් ලිපිය අවලංගු වී ඇති බැවින් 2011.05.01 දින සිට මෙම ගෙවීම අත්හිටුවා ඇත ;

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා 2003.06.05 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි 06/2003 ට අනුව අදාළ ගෙවීම සිදුකර ඇත.

3.5 පාඨමාලා අයවැය ලේඛන හැකිතාක් දුරට අයවැයගත වියදම සත්‍ය වියදමට ගැලපෙන ආකාරයට සකස් කර ඇත. තවදුරටත් පවතින විචල්‍යතාවයන් අවම කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

04 .දක්වා ඇති පාලන ක්ෂේත්‍ර පිළිබඳව වැඩි අවධානයක් යොමුකර දක්වා ඇති අඩුපාඩු මගහරවා ගැනීමට පියවර ගෙන ඇත.

උපාලි අමරසිරි,
අධ්‍යක්ෂ.

| | | | | |
|---|---|---|---|---|
| පිටපත් : | 1. | උපකුලපතිතුමිය | - | කොළඹ විශ්වවිද්‍යාලය |
| | 2. | සභාපතිතුමා | - | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |
| | 3. | ලේකම් | - | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය |
| | 4. | ලේකම් | - | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය. |

01-248

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - තලංගම ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ යෝජනා සම්මුතිය

හරිස්චන්ද්‍ර ගන්හේවා සහ අනෝජා ජානකි ගන්හේවා *විවාහයට පෙර* පෙරේරා

2011.07.01 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. ද සිල්වා විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද 2004.04.01 දින අංක 1076 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද, පිළිවෙලින් 2005.06.07 දින අංක 2762 සහ 2005.11.10 දින අංක 2907 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ.එස්. කේ. හේරත් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ ද 2007.12.12 දින අංක 3034 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. ටී. ධර්මතිලක විසින් සහතික කරන ලද්දා වූද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ ද 2008.02.11 දින අංක 2047 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හරිස්චන්ද්‍ර ගන්හේවා සහ අනෝජා ජානකී ගන්හේවා *විවාහයට පෙර* පෙරේරා ණයකරුවන් හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් හැත්තෑ හතර ලක්ෂ තුන්දහස් තුන්සිය අනූහතයි ශත අනූහතර (රු.74,03,397.94) ක මුදලක් 2011.06.06 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 74,03,397.94 ක මුදලට 2011.06.07 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1076, 2762, 2907, 3034, සහ 2047 දරන උකස් බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තා වූ ද පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාව තුල තලවතුගොඩ පිහිටි "මොරගහවත්ත" හෙවත් "දෙල්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. එන්. එස්. ලක්ෂණ විසින් මැන සාදන ලද අංක 24 සහ 1992.01.03 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් 1" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ලොට් 2 න් ද, නැගෙනහිරට : ලොට් බී, ඩී සහ එෆ් වලින් ද, දකුණට : වරිපනම් අංක 370 ට අයත් බොරැල්ල-පන්නිපිටිය පාරෙන් ද සහ බස්නාහිරට : ලොට් 2 බී වලින්ද මායිම් වූ එකී අංක 24 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තිස් එකයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 31.5) විශාල ඉඩම වේ.

ඉහත අංක දරන බැඳුම්කරයන්හි වඩාත් විස්තර කර ඇති දෙවන උපලේඛනයේ වැඩිදුරටත් විස්තරවන මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

01-350

---

එන් (පීවීඑස්)11773.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "වී. ආර්. සී. එෆ්. ටී. ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1993.09.29 දින සංස්ථාපිත සමාගමක් වන "වී. ආර්. සී. එෆ්. ටී. ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "වී. ආර්. සී. එෆ්. ටී. ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 දෙසැම්බර් මස 21 වැනි දින,
කොළඹ 10,
අංක 400,
ඩී. ආර්. විජේවර්ධන මාවත,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

01-366

---

එන් (පීවීඑස්)32468.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "සෙලින්කෝ සිස්කෝ රණවිරු සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2002.12.23 දින සංස්ථාපිත සමාගමක් වන "සෙලින්කෝ සිස්කෝ රණවිරු සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "සෙලින්කෝ සිස්කෝ රණවිරු සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 දෙසැම්බර් මස 21 වැනි දින,
කොළඹ 10,
අංක 400,
ඩී. ආර්. විජේවර්ධන මාවත,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

01-367

---

එන් (ඒ)1446.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "එපෙක්ස් ඕර්ගනයිසේෂන්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2006.01.10 දින සංස්ථාපිත සමාගමක් වන "එපෙක්ස් ඕර්ගනයිසේෂන්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "එපෙක්ස් ඕර්ගනයිසේෂන්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 දෙසැම්බර් මස 21 වැනි දින,
කොළඹ 10,
අංක 400,
ඩී. ආර්. විජේවර්ධන මාවත,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

01-368

---

එන් (ඒ)1527.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "සහීන් ලංකා තව්හීඩ් ජමා'අත්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2006.06.15 දින සංස්ථාපිත සමාගමක් වන "සහීන් ලංකා තව්හීඩ් ජමා'අත්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "සහීන් ලංකා තව්හීඩ් ජමා'අත්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 දෙසැම්බර් මස 21 වැනි දින,
කොළඹ 10,
අංක 400,
ඩී. ආර්. විජේවර්ධන මාවත,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

01-369

එන් (පීවීඑස්)31016.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "කර්චිනර් ටුවරිස්ටික් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2002.07.11 දින සංස්ථාපිත සමාගමක් වන "කර්චිනර් ටුවරිස්ටික් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "කර්චිනර් ටුවරිස්ටික් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 දෙසැම්බර් මස 21 වැනි දින,
කොළඹ 10,
අංක 400,
ඩී. ආර්. විජේවර්ධන මාවත,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

01-370

එන් (ඒ)1304.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "ස්ක්‍රැප් මෙටල් ට්‍රේඩර්ස් ඇසෝසියේෂන් " හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2005.03.14 දින සංස්ථාපිත සමාගමක් වන "ස්ක්‍රැප් මෙටල් ට්‍රේඩර්ස් ඇසෝසියේෂන් " ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "ස්ක්‍රැප් මෙටල් ට්‍රේඩර්ස් ඇසෝසියේෂන්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 දෙසැම්බර් මස 21 වැනි දින,
කොළඹ 10,
අංක 400,
ඩී. ආර්. විජේවර්ධන මාවත,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

01-371

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.